# 15 ඉරුදින ශුද්ධවත් ලෙස ගත කරමු



15.1 රූපය - ඉරුදින දිව්‍ය යාගයට සහභාගි වන මීසම් ජනතාව

අපි මෙම ගීතිකාව ගායනා කරමු.

අහස පොළොව සිවුපාවුන් ගස්කොළන් මවා
එතුමන්ගේ මහිමෙ නිසා මිනිසා මැව්වා
එතුමන් වදිමු - එතුමන් ගයමු
රස වදනින් එතුමන් හට අපි ගී ගයමු

පුන ගැයුම :

එන්න එන්න ඇතුළු වන්න සමිඳු මැඳුරටා
ගී ගයමින් එතුමන්ගේ මහිමය උදෙසා

කුරුසේ යාගයෙන් අප ව පවින් ගලවලා
සඳ සැපත නැවත අපට හිමි කර දුන්නා
එතුමන් ගයමු - එතුමන් වදිමු
එම යාගය නැවත පුදමු අපි සැම බැතියෙන්

(කිතුනු ගී අංක 08)

මෙම ගීතිකාවේ සඳහන් අකාරයට;

1. ඔබට ආරාධනා කරන්නේ කුමන ස්ථානයකට ඇතුළු වීමට ද?
2. කුමන කාර්යයක් කිරීම සඳහා ඔබට ආරාධනා කරයි ද?
3. ගැයුමෙන් වැයුමෙන් දෙවි පියාණන්ට වන්දනා කිරීම යෝග්‍ය බවට හේතු **දෙකක්** ඉදිරිපත් කරන්න.
4. ජේසුස් වහන්සේගේ කුරුසියේ යාගයෙන් අපට හිමි කර දුන්නේ කුමක් ද?
5. දෙවියන් වහන්සේට නමස්කාර, ප්‍රශංසා හා ස්තුති කිරීමට මීසම් සංසයක් ලෙස සතියකට වරක් අනිවාර්යයෙන් එකතු වන දිනය කුමක් ද?

සබත් දවස ශුද්ධ ලෙස පැවැත්වීමට සිතට ගන්න. දවස් හයක් තුළ නුඹ වෙහෙස වී නුඹේ සියලු වැඩ කළ යුතු ය. එහෙත් හත්වන දවස නුඹේ දෙවි සමිඳාණන් වහන්සේට කැප වූ සබත ය. එදින නුඹවත්, නුඹේ පුතුවත්, දුවවත්, නුඹේ සේවකයා වත්, සේවිකාවවත්, නුඹේ සතෙකුවත්, නුඹේ වාසල් දොරටු සීමා ඇතුළ සිටින අමුත්තෙකුවත් කිසි වැඩක් නොකළ යුතු ය. මන්ද, සමිඳාණන් වහන්සේ වන මම දින හයක් තුළ අහස හා පොළොව ද සමුද්‍රය ද ඒවායේ ඇති සියල්ල ද සාද, සත් වන දවස නිවාඩු ගත්තෙමි. එබැවින් උන් වහන්සේ සබත් දවසට ආශීර්වාද කොට එය විශුද්ධ කළ සේක.

(නික්මයාම 20:8-11)

ඉරු දිනත් ඝෘය මංගල්‍ය දිනත් ශුද්ධ ලෙස ගත කරන්න.

මෙම දේව පනතට අනුව ඉරු දිනයේ දීත් ශුද්ධ වූ සභාව ඝෘය මංගල්‍යයන් ලෙස නම්කර ඇති දිනයන්හි දීත් අප අනිවාර්යයෙන් ම දිව්‍ය පූජාවට සහභාගි විය යුතු ය. එබැවින් එම ඝෘය මංගල්‍ය දින අප දැන සිටීම වැදගත් ය.

## ශ්‍රී ලංකාවේ කතෝලිකයන්ට නියම වන ණය මංගල්‍ය දිනයන්

| | | | |
|---|---|---|---|
| 1. | සැම ඉරුදිනක් ම | | |
| 2. | ජනවාරි 01 | - | පරිශුද්ධ දේව මාතාවන්ගේ මංගල්‍යය |
| 3. | අගෝස්තු 15 | - | මරියෝත්තමාවන්ගේ ස්වර්ගාරෝපණ මංගල්‍යය |
| 4. | දෙසැම්බර් 08 | - | දෙව් මවුන්ගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍යය |
| 5. | දෙසැම්බර් 25 | - | නත්තල් මංගල්‍යය |

අප විසින් ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහස හෙවත් ක්‍රිස්තුන් වහන්සේගේ **දුක්විඳීම, මරණය හා උත්ථානය** ප්‍රධාන වශයෙන් ඉරුදිනයන්හි සිහිපත් කරනු ලැබේ. උන්වහන්සේ සකල මිනිස් වර්ගයාගේ ම පාපවලට තම අමිල වූ රුධිරයෙන් වන්දි ගෙවා අප සැමට එම යාගය තුළින් පව් සමාවත් ස්වර්ග රාජ්‍යයේ උරුමයත් හිමි කර දුන් සේක.

එසේ පව් සමාව ලබා ගත් අප සැම මහත් ප්‍රීතියකින් හා උද්යෝගයකින් මීසම් පවුලක් ලෙස එකමුතු ව හා එක්සිත් ව ඉරුදින දිව්‍ය යාගයට සහභාගි විය යුතු ය. මරණය පරාජය කොට උත්ථානයේ ජයග්‍රහණය අත්කර දීම සඳහා තම එක ම පුත්‍රයාණන් වහන්සේ මෙලොවට එවීමට තරම් දෙවි පියාණන් වහන්සේ අපට ප්‍රේම කළ සේක. එබැවින් අප සැම දෙවි පියාණන් වහන්සේටත් මිනිස් වර්ගයා පාපයෙන් මුදා ගැනීමට දිවි පිදූ ක්‍රිස්තුන් වහන්සේටත් අපගේ වන්දනාව, ප්‍රශංසාව හා ස්තුතිය පුද කිරීම ඉරුදින දිව්‍ය යාගයේ ප්‍රධානතම අරමුණ යි.

අපගේ ජීවිත ශුද්ධ ලෙස හා ධර්මිෂ්ඨ ලෙස ගත කිරීම දෙවි පියාණන් වහන්සේ නිරන්තරයෙන් අපගෙන් බලාපොරොත්තු වන සේක. එබැවින් අප මවා සියල්ල අපට දනය කරන දෙවි පියාණන් වහන්සේට අපගේ කෘතඥතාව ප්‍රකාශ කළ හැකි මාර්ග අපි දැන් විමසා බලමු.

- ★ ඉරුදිනවලත් ණය මංගල්‍ය දිනවලත් මුළු දිව්‍ය පූජාවට ක්‍රියාශීලි ව සහභාගිවීම
- ★ දහම් පාසලට සහභාගි වී දෙවි පියාණන් වහන්සේ ගැන දැනුම වර්ධනය කර ගැනීම

- තම පවුල තුළ එකමුතුකම වර්ධනය කර ගැනීමට අවස්ථා සොයා ගැනීම (උදහරණ:- එකට ආහාර ගැනීම, යාච්ඤා කිරීම)
- ආධ්‍යාත්මික පෝෂණය ලබා දෙන්නා වූත්, ස්වේච්ඡා සේවාවන් කරන්නා වූත් විවිධ සමිති සමාගම්වලට සම්බන්ධ වීම
- තම මිතුරන් ව ද ඉරුදින දිව්‍ය පූජාවට කැඳවාගෙන යාම
- රෝගී වූවන් බැලීමට යාම
- අසරණයන්ට පිහිට වීම

## සබත් දවසේ දී අප විසින් නොකළ යුතු කාර්යයන්


1. දිව්‍ය පූජාව අතපසු කිරීම
2. ඉරුදින දිව්‍ය පූජාවට හා දහම් පාසලට සහභාගී නොවී උපකාරක පන්තිවලට හෝ විනෝද ගමන් බිමන් යාම
3. ඉරුදිනවල අනවශ්‍ය ලෙස මුදල් ඉපැයීමේ කාර්යයන්හි නිරතවීම
4. දේවස්ථානය තුළ කතා කිරීම, විහිළු තහළු කිරීම, ජංගම දුරකථන භාවිත කිරීම වැනි ක්‍රියා
5. අසංවර ඇඳුම් විලාසිතාවන්ගෙන් දිව්‍ය පූජාවට පැමිණීම

සබත් දිනවල හා ණය මංගල්‍ය දිනවල නොකළ යුතු කාර්යයන්හි නියැලීමෙන් එදින ඔබ තුළ පවත්වා ගත යුතු ශුද්ධවන්තභාවය විනාශ වී යන බව සිහි තබා ගත යුතු යි.

ඉරු දිනත්, අන් දිනවලත් ශුද්ධ ලෙස හා ධර්මිෂ්ඨ ලෙස ගත කරන විට, ඔබ දෙවි පියාණන් වහන්සේට ප්‍රසන්න දරුවකු වෙනවා නොඅනුමාන යි. එවිට ඔවුන් වහන්සේගේ කරුණාව හා ආශිර්වාදය බහුල ලෙස ඔබගේ ජීවිතයට ලැබෙනු ඇත. ඔබේ ජීවිතය දේව ආශීර්වාදයෙන් හා සතුටින් පිරුණු ජීවිතයක් බවට පත්වෙයි. එබැවින් ඔබ හැම විට ම ශුද්ධවන්ත ව හා ධර්මිෂ්ඨ ලෙස ජීවත්වන්නට උත්සාහ කරන්න.

**ක්‍රියාකාරකම**

(1) ප්‍රහේළිකාව පුරවන්න.




**උපකාරක පද**

**පහළට :**

1. ශුද්ධ බයිබලයේ සබත් දවස ශුද්ධ ලෙස ගත කිරීමට උපදෙස් දී ඇති එක් ග්‍රන්ථයකි.
2. සබත් දින මෙවැන්නන් බැලීමට යාම උතුම් ක්‍රියාවකි.
3. ඉරුදිනයන්හි දී විශේෂයෙන් ම අප ජීවිත මෙලෙස ගත කිරීමට උත්සාහ කළ යුතු ය.
6. ඉරුදිනයන්හි දි වැඩි වැඩියෙන් මෙම ක්‍රියාවල නිරතවීම දෙවි පියාණන්ට ප්‍රසන්න වේ.
7. සබත ගැන කියැවෙන්නේ කී වැනි පනතින් ද?

**හරහට :**

4. සැම දෙනා සමඟ ම "එකමුතුකමින්" කටයුතු කිරීම යන අර්ථය දෙන පදයකි.
5. ක්‍රිස්තුන් වහන්සේ පරාජය කළේ මෙය යි.

8. ඉරුදින මෙම පාසලට සහභාගිවීමෙන් දෙවි පියාණන් පිළිබඳ දැනුම වර්ධනය කරගත හැකි වේ.
9. ඉරුදින මේ නමින් හැඳින් වේ.

(2) පිළිතුරු ලියන්න

1. දෙවි මවුන් වෙනුවෙන් පැවැත්වෙන ණය මංගල්‍ය දිනයන් හා මංගල්‍යයන් ලියන්න.
2. ඉරුදින අප විශේෂයෙන් සිහිපත් කරන සිදුවීම කුමක් ද?
3. දෙවි පියාණන් වහන්සේගේ ආශිර්වාද ලබා ගැනීමට අප ජීවත් විය යුත්තේ කවර ආකාරයට ද?

(3) පහත සඳහන් වගුව ඔබේ අභ්‍යාස පොතේ සටහන් කර ගෙන සම්පූර්ණ කරන්න.

| සබත් දිනයේ දී අප විසින් කළ යුතු දේ | සබත් දිනයේ දී අප විසින් නොකළ යුතු දේ |
|---|---|
| 1 | 1 |
| 2 | 2 |
| 3 | 3 |
| 4 | 4 |



**ජීවිතයට බිඳක්**

දිව්‍ය පූජාවට සහභාගි වනවිට;

★ හඬනගා යාච්ඤාවලට පිළිතුරු දෙමු.
★ කට පාඩමින් කිව නොහැකි යාච්ඤා පොත පෙරළාගෙන උච්චාරණය කරමු.
★ ගීතිකා පොතක් භාවිත කරමු.
★ යාච්ඤා කරන විට අත් වැඳගෙන සිටිමු.
★ වට පිට නොබලමු.
★ විහිළු නොකරමු.
★ අදාල ඉරියව් ප්‍රදර්ශනය කරමු.